# ජාතික කාන්තා කමිටුව සඳහා නව සාමාජික මණ්ඩලයක් පත් කිරීම

1993 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන ලද “කාන්තා ප්‍රඥප්තිය” ප්‍රකාර කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ප්‍රතිස්ථාපනය කර ඇති ජාතික කාන්තා කමිටුව, කාන්තාව හා නීතිය, සෞඛ්‍ය, ආර්ථික සංවර්ධනය, අධ්‍යාපනය, විද්‍යාව හා තාක්ෂණය, පරිසරය ආදී ක්ෂේත්‍රයන් පිළිබඳව කරුණු සොයා බලා කාන්තාව ආර්ථික මෙන්ම සමාජයීය වශයෙන් සවිබල ගැන්වීම හා විශේෂයෙන් ශ්‍රී ලාංකික කාන්තාව සමාජයීය වශයෙන් මුහුණපාන ගැටළු තුරන් කිරීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ග විමර්ශනය කර, යෝජනා හා නිර්දේශ, ප්‍රතිපත්ති සම්පාදකයන් වෙත ඉදිරිපත් කිරීමේ වගකීම් සම්භාරය පැවරී ඇති රාජ්‍ය ආයතනයකි.

කාන්තා ප්‍රඥප්තියේ ජාතික කාන්තා කමිටුව ස්ථාපනය කිරීම යන පරිච්ඡේදය යටතේ 17(2) වගන්තිය ප්‍රකාර ඉහත සඳහන් ක්ෂේත්‍ර වල විශිෂ්ඨත්වයක් ලැබුවා වූද, පොදු පිළිගැනීමක් ඇත්තා වූද, විද්වත් මණ්ඩලයක් වසර 4 ක කාලසීමාවක් සඳහා අතිගරු ජනාධිපතිතුමන් විසින් තෝරා පත් කරනු ලබයි.

කාන්තා ප්‍රඥප්තියෙන් ප්‍රකාශිත අරමුණු ඉටු කර ගැනිම සඳහා පත් කරගන්නා ලද ජාතික කාන්තා කමිටුවේ නව සාමාජික සාමාජිකාවන්ගේ සමාරම්භක රැස්වීම 2018-09-11 දින පස්වරු 2.00 ට ජාතික කාන්තා කමිටු ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.



**2018 අගෝස්තු මස පත් වූ නව කමිටු සාමාජික සාමාජිකාවන්**

ස්වර්ණා සුමනසේකර මහත්මිය - සභාපති

එම් ඒ අනුලා ඉන්ද්‍රානි මහත්මිය - විධායක අධ්‍යක්‍ෂ - සාමාජික

විජිතා සෙනෙවිරත්න මහත්මිය - අතිරේක ලේකම් (සංවර්ධන) - සාමාජික

රංජිත් වික්‍රමලාල් කුලසිංහ මහතා - සාමාජික

මහාචාර්ය කමිනා ගුණරත්න මහත්මිය - සාමාජික

මහාචාර්ය කමලා ලියනගේ මහත්මිය - සාමාජික

වෛද්‍යා ලක්ෂ්මි සෝමතුංග මහත්මිය - සාමාජික

ආචාර්ය සේපාලි කෝට්ටේගොඩ මහත්මිය - සාමාජික

ආචාර්ය අනුෂා එදිරිසිංහ මහත්මිය - සාමාජික

අන්බේරියා හනීෆා මහත්මිය - සාමාජික

චූලනි කොඩිකාර මහත්මිය - සාමාජික

මුම්ටාස් සිරිවර්ධන මහත්මිය, - සාමාජික

විශාකා ධර්මදාස මහත්මිය - සාමාජික

යන මහත්ම මහත්මීන් කමිටු සාමාජික සාමාජිකාවන් ලෙස තනතුරු දරනු ලබන අතර, ඔවුන් විසින් කාන්තා ප්‍රඥප්තියේ සඳහන් විෂමතාවයන් පිළිබඳ වඩා අවධානය යොමු කිරීමටත්, ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදනය, පර්යේෂණ හා උද්දේශන කටයුතු පිළිබඳව වැඩි අවධානයක් යොමු කර ක්‍රියා කිරීමටත් තීරණය කරන ලදි.

